# මලෛහම් ජනතාවගේ ඉඩම්, නිවාස, අධ්‍යාපනය ඇතුලු මූලික අයිතීන් තහවුරු කරමු.!

# மலையக மக்களின் காணி, வீடு மற்றும் கல்வி உட்பட அடிப்படை உரிமைகள உறுதிப்படுத்துவோம்.!

දකුණු පළාත (මාතර හා ගාල්ල දිස්ත්‍රික්කය) හා බස්නාහිර පළාතේ (කළුතර දිස්ත්‍රික්කය) ආන්තික ජනකොටසක් ලෙස ජීවත්වන මලෛයහම් ජනතාව විසින්
අගමැතිතුමියට හා රජයට භාර දෙන යෝජනාවලිය

**தென் மாகாணம் (காலி மற்றும் மாத்தறை மாவட்டங்கள்) மற்றும் மேல் மாகாணத்தில் (களுத்துறை மாவட்டம்) வாழுகின்ற மலையக மக்களால் இலங்கை சனநாயக சோசலிஷக் குடியரசின் பிரதமர் மற்றும் அரசாங்கத்துக்கு கையளிக்கும் முன்மொழிவுகள்.**

**2025.01. 16**




**Voice of the Plantation people Organization**
**No 2/1, Ave Maria Road Negombo.**
**Tel - +94313134314 / +94-777034136**
**Email :voiceplantation@gmail.com/denialdas@gmail.com**
**Blog:www.voppnews.blogspot.com**
**Facebook : https://web.facebook.com/VOPPSL**

**වසර 200 ක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ආර්ථිකයට විශාල දායකත්වයක් ලබාදෙන මලෙයගම් ජනතාවගේ, විශේෂයෙන් දකුණ සහ බස්නාහිර පළාත් මලෙයගම් ජනතාවගේ අභිවෘද්ධිය සඳහා මාතර, ගාල්ල සහ කළුතර දිස්ත්‍රික් මලෙයහ ජනතා නියෝජිතයන් වතුකරයේ ජනතා හඬ සංවිධානය සමග එකතුවී අගමැතිතුමියට හා ආණ්ඩුවට ඉදිරිපත් කරන යෝජනා.**

“වතුකරයේ ජනතා හඬ” සංවිධානය දකුණු පළාතේ මාතර, ගාල්ල, කළුතර, කුරුණෑගල හා මලෙයගම් ප්‍රදේශ වලින් (වතුකරයේ) සංක්‍රමණයවී මේ වන විට ගම්පහ දිස්ත්‍රික්කයේ විවිධ පීඩාකාරී තත්වයන් තුළ ජීවත්වන මලෙයගම් ජනතාව සමග ඒකාබද්ධව කටයුතු කරමින් මලෙයගම් ජනතාවගේ අයිතීන් සහ සුභසාධනය උදෙසා ක්‍රියාත්මක වන සිවිල් සංවිධානයක්වේ. එසේ මලෙයගම් ජනතාව සමග කටයුතු කරන විට ඔහුන් මුහුණ දෙන විශාල ගැටළු හඳුනා ගැනීමට හැකිවූ අතර ඔහුන් සමග එකතුවී මෙම ගැටළු සඳහා තිරසාරවූ විසඳුම් සෙවීම සඳහා විවධ ක්‍රියාමාර්ග ගනිමින් කටයුතු කරන්නෙමු. එයින් තවත් ඉතා වැදගත් අවස්තාවක් ලෙස අද දින ඔබ සමග කරන සාකච්ඡාව කිව හැකිය. ඒ අනුව දකුණ සහ බස්නාහිර මලෙයහම් ජනතාව මුහුණ දෙන ගැටළුවලට තිරසර විසඳුම් ලබා ගැනීම සඳහා ඉහත සඳහන් දිස්ත්‍රික්ක 03හි නියෝජිතයන් හා වතුකරයේ ජනතා **හ**ඬ සංවිධානයේ නියෝජිතයන් විසින් සකස් කරන ලද යෝජනාවලිය ඔබතුමිය වෙත භාර දෙමු. රටේ දෙවැනි පුරවැසියා හා ඉහළ තනතුරක් දරන ඔබතුමිය මේ පිලිබඳව අවධානය යොමු කර අදාළ රාජ්‍ය ආයතන සමග සාකච්ජා කර මලෙයහම් ජනතාව විඳින පීඩන තත්වයෙන් ඔහුන් මුදවා ගන්නා ලෙස කාරුණිකව ඉල්ලා සිටිමු.

**ඉඩමක අයිතිය/ඉඩමේ නීත්‍යානුකූල හිමිකාරිත්වය**

1. 1993 - 2024 වර්ෂය දක්වා විවිධ අවස්ථාවල ගාල්ල, මාතර හා කලුතර දිස්ත්‍රික්කවල මේ දක්වා පර්චස් 7ක ඉඩම් ලබාදී ඇති මලෙයගම් ජනතාවගේ එම ඉඩම්වලට ඔප්පු ලබා දී, ඉඩමේ නීත්‍යානුකූල හිමිකාරිත්වය තහවුරු කිරීම සඳහා කඩිනමින් පියවර ගැනීම.
2. මෙතෙක් ඉඩම් හෝ නිවාස නොලැබුණු බස්නාහිර හා දකුණේ මලෙයගම් ජනතාවට ඉඩම් හා නිවාස ලබා දීමට කටයුතු කිරීම. රජය විසින් මලෙයගම් ජනතාව සඳහා දියත් කරන ඉඩම් සහා නිවාස ලබාදීමේ ව්‍යාපෘතියට මාතර, ගාල්ල සහ කලුතර දිස්ත්‍රික්ක 03 ද ප්‍රමුකතා ගත කිරීමට පියවර ගැනීමට කටයුතු කිරීම සහ වැවිලි ඉඩම් ආරවුල් සඳහා විශේෂිත කාර්ය සාධක බලකායක් නිර්මාණය කිරීම.
3. ඉඩම් ලැබුණු පුද්ගලයින්, ඉඩම් සහ නිවාස ඇති පුද්ගලයින් මෙන්ම ඉඩම් හිමිකම් ලබා දී ඇති පුද්ගලයින්ගේ සංඛ්‍යාව ඇතුළුව සවිස්තරාත්මක දත්ත ඒකරාශී කිරීම සඳහා විදිමත් යන්ත්‍රනයක් ගොඩ නැගිම. වතුකරයේ ජනතා හඬ සංවිධානයට එය සඳහා පූර්ණ සහයෝගය දැක්වීමට හැකි බව දන්වා සිටිමු.

**මලෙයගම් ජනතාවගේ මූලික පහසුකම් ගොඩ නැගීම හා රාජ්‍ය සේවාවන්, මලෙයගම් ජනතාවටද නිසි අයුරින් ලබා දීම.**

1. වතු ආශ්‍රිතව මූලික සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා ප්‍රාදේශීය වශයෙන් රෝහල් පහසුකම් ඇති කිරීමට කටයුතු කිරීම සහ දැනට පවතින රෝහල් සහ සායනවලට පැමිණෙන රෝගීන් සඳහා අවශ්‍ය පහසුකම් ලබාදිම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් සකස් කිරීම.
2. පානීය ජලය, වැසිකිලි පහසුකම් හා මේ වන විට ප්‍රාදේශීය සභා හරහා වතු තුල කසල එකතු කිරීමේ ක්‍රියාවලිය නිසි පරිදි සිදුනොවන බැවින්, කසල බැහැර කිරීම සඳහා වන මූලික පහසුකම් නිසිලෙස සංවර්ධනය කිරීමට පියවර ගැනිම.
3. වතුවලට සහ ඉන් පිටතට නිසි ප්‍රවේශයන් සහතික කිරීම සඳහා මාර්ග ඉදිකිරීම්, ප්‍රතිසංස්කරණය කිරීම් සහ විධිමත්ව නඩත්තු කිරීමට කටයුතු කිරීම.
4. මේ වන විට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබාදුන් තීන්දුවට අනුගතව වතු තුල තැපැල් බෙදා හැරීම විධිමත් කිරීම සඳහා වතුවල ජීවත්වන මලෙයගම් ප්‍රජාවගේ සෑම නිවසකටම වෙනම ලිපිනයන් ලබා දීම සඳහා කඩිනමින් බලධාරීන් කටයුතු කිරීම.
5. රජයෙන් ලබා දෙන අස්වැසුම, හා වැඩිහිටි දීමනා නොලැබුනු වතුවල ජීවත්වන මලෙගම් ජනතාවටද එම දීමනා ලබා දීමට කටයුතු කිරිම සහ එහි ඇති අක්‍රමිකතා පිළිබඳව සොයාබැලීමට විනිවිදභාවයෙන් යුක්ත වැඩපිළිවෙලක් සකස් කිරීම .

6. රජයේ ආයතන සඳහා දෙමළ භාෂාවෙන් කටයුතු කල හැකි දමිල රාජ්‍ය නිලධාරින් පත්කිරීම හෝ පුරප්පාඩු පිරවීම සඳහා කඩිනමින් පියවර ගැනීම .
7. වතුකම්කරු ජනතාවගේ වැටුප් වැඩි කිරීම සඳහා කඩිනමින් පියවර ගැනීම.

**මලෙයගම් දරුවන්ගේ පාසල් අධ්‍යාපනය හා වෘත්තිය පුහුණු පහසුකම් ගොඩනැගිම.**

1. දකුණු පළාතේ දමිල පාසල් 10 හා කලුතර දිස්ත්‍රික්කයේ පාසල් 40 තුල ගණිතය / විද්‍යාව / ඉංග්‍රිසි සංගීතය නැටුම් හා ක්‍රිඩා වැනි විෂයන් සඳහා අනිකුත් පාසල් වලට සාපේක්ෂව ගුරුවරුන් ස්ථාපිත කිරීම සඳහා කඩිනමින් පියවර ගැනීමට කටයුතු කිරීම.
2. දකුණු පළාතේ වතු ආශ්‍රිත දමිල පාසල් තුල හා කලුතර දිස්ත්‍රික්කයේ වතු ආශ්‍රිත දමිල පාසල් තුල උසස් පෙල හදාරණ දරුවන් සඳහා ගණිතය හා විද්‍යාව විෂයන් හැදෑරීම සඳහා අවශ්‍ය ගුරුවරුන් පත්කිරීම හා අදාල පහසුකම් ලබාදීම සඳහා පියවර ගැනීමට කටයුතු කිරීම.
3. වතු ආශ්‍රිත පාසල් වලට ගුරුවරුන් පත්කිරීමේදී එම ප්‍රදේශ නියෝජනය කරන මලෙයගම් ගුරුවරු ගුරුවරියන් සඳහා ප්‍රමුඛතාවය ලබාදීම.
4. වතු ආශ්‍රිත පාසල් වල මූලික යටිතල පහසුකම් ලබා දීම සඳහා කටයුතු කිරීම.
5. පාසල් අධ්‍යාපනය අවසන් කර ඇති මලෙයගම් තරුණ තරුණියන් සඳහා දමිල භාෂාවෙන් ක්‍රියාත්මක වන වෘත්තිය පුහුණු මධ්‍යස්ථාන ඇති කිරීම සහ ඒ ආශ්‍රිත රැකියා අවස්ථා බිහි කිරීම.
6. දකුණු පළාතේ හා බස්නාහිර පළාත් වතු ප්‍රදේශවල ජීවත් වන මලෙයගම් ජනතාවගේ දරුවන්ගෙන් වැඩි ප්‍රමාණයක ගැහැණු දරුවන් පාසල් අධ්‍යාපනය මගදී හැර යයි. මේ පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශය සහ අධ්‍යාපන දෙපාර්තමේන්තුව ගැඹුරු විශ්ලේෂණයක් කර දකුණු පළාතේ හා බස්නාහිර පළාතේ දරුවන්ගේ පාසල් අධ්‍යාපනය ඉහළ නැංවීමට පියවර ගැනීම සඳහා කටයුතු කිරීම.
7. මලෙයගම් දරුවන්ගේ අයිතීන් හා සංස්කෘතික හැකියාවන් වර්ධනය කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හරහා විශේෂ වැඩ පිළිවෙලක් සකස් කිරීම.
8. ගාල්ල, මාතර හා කලුතර දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක වන කුඩා හා පෞද්ගලික වතුවල අවුරුදු 16 ට අඩු ළමුන් ළමා ශ්‍රමිකයන් ලෙස කටයුතු කරන බවට තොරතුරු වාර්තාවුවත් ඒ පිලිබඳව ඔවුන් සාක්ෂි දැරීමට බියවේ. එබැවින් ඒ පිලිබඳව සොයා බලා අදාල නීතිමය පියවර ගැනීම සඳහා විශේෂ කමිටුවක් පත්කිරීම.

**මලෙයගම් කාන්තාවන්ගේ අභිවෘද්ධිය ගොඩ ගැනීම.**

1. මලෙයගම් කාන්තාවන් ද සමාජීය පිළිගැනීමකට ලක්කිරීම සඳහා මලෙයගම් කාන්තාවන්ගේ (කඳුකර) අධ්‍යාපනය සහ පෞරුෂ සංවර්ධනය සඳහා ප්‍රාදේශීය කොට්ඨාශ මට්ටමින් විශේෂ වැඩපිළිවෙළක් සකස් කිරීමට පියවර ගැනීම.
2. කාන්තාවන් සඳහා ප්‍රාදේශීය, රාජ්‍යය සහ පළාත්පාලන මට්ටමින් ලබාදෙන සේවාවන් වතුකරයේ කාන්තාවන්ටද ලබා ගැනීමට නිසි ක්‍රමවේදයක් සැකසීම.
3. වතුවල සේවය කරන මලෙයගම් කාන්තාවන්ගේ අනාගත ඉතුරුම් සඳහා ඇති EPF / ETF ලබා නොදෙමින් ක්‍රියාත්මක වන Out Grower System (වතු කම්කරුවන්ට තේ වතු කුඩා ප්‍රමාණ වලට බෙදා වෙන්කර ඒවා නඩත්තු කිරීම සඳහා භාරදීමේ ක්‍රියාවලිය) වහා ඉවත් කර, පැරණි ක්‍රමයටම කාන්තාවන්ට දෛනික රැකියාව ලබාදීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
4. ග්‍රාමීය කාන්තාවන් විධිමත් බැංකු මඟින් ණය ලබා ගැනීමට යොමු නොවීමට ප්‍රධාන හේතුව වන්නේ විධිමත් බැංකු ණය නිකුත් කිරීමේදී විවිධ ලිපි ලේඛන සම්පූර්ණ කිරීමට හා ඇප කොන්දේසි සපුරාලීම මඟින් කාන්තාවන් අපහසුතාවයට පත් කිරීමයි. ඒ අනුව සරල ක්‍රමවේද තුළින් විධිමත් බැංකු ක්‍රමවේදයක් මඟින් කාන්තාවන්ට සුවිශේෂී වන ණය ලබා ගැනීමට හැකි ක්‍රියාවලියක් හඳුන්වා දීම.

5. තේ වතුවල වැසිකිළි පහසුකම් හා විවෙකාගාරයක් නොමැති බැවින් එහි සේවය කරන කාන්තාවන් දැඩි පීඩාවට ලක්වේ. එබැවින් මෙය පිලිබඳව අවධානය යොමු කර අදාළ පහසුකම් ලබා දෙන ලෙස වතු සමාගම්වලට උපදෙස් ලබා දීම.

6. තම පවුල්වල දරිද්‍රතාවය සහ ඔවුන්ගේ දරුවන්ගේ අනාගතය සුරක්ෂිත කිරීමේ අරමුණින් ගෘහ සේවිකාවන් ලෙස විදේශගතවන මලෙයගම් කාන්තාවන්ගේ පවුල්වල සහ දරුවන්ගේ තත්ත්වය නිරීක්ෂණය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා විශේෂ වැඩපිළිවෙළක් සකස් කිරීමට පියවර ගැනීම.